# පොසොන් උදාන ගී සරණිය

**විජේරත්න පතිරාජ**

**කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපය**



උණු කැවුම් සුවඳ දස අතර පැතිර යද්දී ශ්‍රී ලාංකිකයන්ගේ භෞතික පැවැත්ම බක් මාසය පුරාම පවතින්නේ සූර්ය මංගල්‍යයේ චමත්කාර උත්සව විලාසයෙනි. එය නිම වී වෙසක් මස උදාවත්ම භෞතික සෞන්දර්යයෙන් වෙන් වී දාන ශීල බාවනාදී අධ්‍යාත්මික පාරමිතාවන්ට බරව බුදුන් වහන්සේගේ උත්පත්තිය බුද්ධත්වය හා පරිනිර්වාණය මුල් කොට ගත් තෙමගුල සමරණ බෞද්ධයේ බුද්ධාලම්භන ප්‍රීතියේ අසිරිමත් බව විවිධ පුණ්‍ය ක්‍රියා මධ්‍යයේ සමරති. මෙම උත්සව දෙක පදනම් කරගෙන බිහි වූ සිංහල ගීත සාහිත්‍යයේ මිහිර විඳ ගැනීමට පසුගිය ලිපි දෙකෙහි ඉඩ හසර වෙන් කල අපට ඊළගට උදාවන ශ්‍රී ලාංකිකයන් වන අපට අද්විතීය වූ මේ මේ පොසොන් උදානය පිලිබඳව මෙම කලාපයෙන් අවධානය යොමු කිරීම නොවැළැක්විය හැක්කකි.

පොසොන් උදානය ශ්‍රී ලාංකිකයන්ගේ අති උතුම් වූත් විශිෂ්ට වූත් සිංහල බෞද්ධ



උළෙල ලෙස සැළකෙන්නේ ඒ සිංහල දෙස බස රැස නිපන් ඓතිහාසික මොහොත සටහන් වන හෙයිනි. එය බුදුන් වහන්සේගේ ද ප්‍රාර්ථනයක් ලෙස අනුබුදුහිමි මහින්ද මහ රහතන් වහන්සේ ප්‍රමුඛ පිරිස විසින් මෙරට බුදුන් වහන්සේගේ දේශයක් බවට පත් වීමේ ඓතිහාසික පුරාණය සනිටුහන් කරන ලද පුණ්‍යකර්මය වන්නේය. ජාත්‍යන්තර ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානය බවට අද මෙරට පත්වීමට බල පෑ ඓතිහාසික මංගල්‍යය උදා වූයේ පොසොන් පෙහොය පදනමේ බව කිව යුතුය. බුදුන් වහන්සේ පරිනිර්වාණ මංචකයේදී ශක්‍රදේවේන්ද්‍රයාණන්ට ලංකා ද්වීපයේ සුරක්ෂිත බව පවරන්නේ එය අනාගත බුද්ධ ශාසනය පවතින එකම දේශය බවට පත්වන බව දේශනා කරමිනි. ඒ අනුව බුද්ධ ශාසනයේ උත්තම ප්‍රතිෂ්ඨානය සිදුවන්නේ පොසොන් උදාවේ මහින්දාගමන යත් සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීමත් සමගම ස්ථාපිත වන බෞද්ධ සංස්කෘතිය මුල් බැස ගැනීමෙනි. මෙම ඓතිහාසික පුරාණය පිළිබඳව ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘති රැසක තොරතුරු සඳහන් වෙයි. මෙහිදී අවධානය යොමුවන්නේ පොසොන් උදාන සංගීත සාහිත්‍යයේ ප්‍රකට නිර්මාණ පිළිබඳවය.

ක්‍රි පූ තුන්වන සියවසේදී මිහිඳු මහ රහතන් වහනේසේ මිහින්තලාවට වැඩි ඓතිහාසික වංශකතාව ඒ අයුරින්ම ඉදිරිපත් කරමින් විවියන් බොරලැස්ස ගායිකාවගේ පහත සඳහන් ග්‍රැමෆෝන් තැටි ගීකය මෙරට ඇති පැරණිම පොසොන් ගීතය ලෙස පෙනී යයි.

ගීතය 1

## නවතින්න තිස්ස ඇයි මේ

**නවතින්න තිස්ස ඇයි මේ නොදුවන් මුවාගෙ පස්සේ**
**කියූ මිහිඳු රහත් සමිඳා - ඒ මිහින්තලා කන්-දේ //**
**නවතින්න....**

**මගෙ නාමෙ කියා මෙලෙසේ කව්දෝ මට අමතන්නේ**
**ඒ තිස්ස නිරිඳි රොස් වී බැලුවා මහ ගත මුදුනේ //**
**දටුවා මහින්ද සමිඳා බැලුවා දයාව පාලා//**
**නවතින්න...//**

**දෙසුවා බුදුන්ගෙ ධර්මේ**
**ඇති සේ තතු පහදාලා**
**තුන් සරණෙ පිහිට සෙව්වා**
**රජිඳා පහන්ව සීලේ**
**දම් සිහිලෙ සුවය එකදා**
**ලක් මවට තුරුලු වූවා**
**මෙත් අරුණ සමග සීලෙන්**
**සිංහලය මිහිරි වූවා**

**නවතින්න.//**

දඩයම් කෙළියේ යෙදී සිටි දේවානම් පියතිස්ස රජු සහ පිරිස මුවකු පසු පස ලුහුබඳිද්දී රජුගේ නමින් ආමන්ත්‍රණය කොට නවතින්න සළස්වා දුනු දිය හැර දමා ධර්ම විජයට නැඹුරු වීමේ ඓතිහාසික පුරාණය සිහිපත්කෙරෙන මෙම ගීතය මෙරට අතිශයින් ජනප්‍රිය වූවකි.

ගීතය 2

## දුර පෙනෙන තැනිතලා

**දුර පෙනෙන තැනිතලා**
**අනුරාධපුර දිහා**
**පුන් පොහොය දා මේ ශ්‍රියා සාදු කිය කියා**

**ඈත කිරි පාට පේන සරු සාර සෑය**
**දිළෙනවා//**
**නැගෙන රිදී සීණු හඬින් නුවර එළි කළා//**

**දුර පේන..**

**ජේතවනා රාම අභයගිරි වෙහෙර**
**සාදු කිය කියා**
**කරමු වන්දනා**
**යමුද අනේ ඉවුර දිගේ තිසා වැව වටේ//**

**දුර පේන තැනිතලා..//**

අනුරපුර බොදු කෙම් බිම බවට පත්වන්නේ මහසෑය ප්‍රමුඛ අහස උසට නැගුණ චෛත්‍ය වෙහෙර විහාර ඉදිවීමෙනි. මහමෙව්නා උයනේ අනාගතයේදී මහාස්ථූපය ඉදි වන බව මිහිඳු මහ රහතන් වහන්සේ විසින් රන් පතක සටහන් කරන ලද බව කියවේ. දුටුගැමුණු රජ සමය වන විට ඒ ප්‍රාර්ථනා ඉටු වී අනුරපුර මිහිබට සුරපුරක් මෙන් බොදු සංස්කෘතියෙන් ඔපමට්ටම් විය. විවියන් බොරළරස්ස ගතායිකාවගේම මෙම පැරණි රසාංගයෙන් ප්‍රකාශවන්නේ එම අසිරිමත් ශාසනික සශ්‍රීකතාවයි.

ගීතය 3

## මල් සුගන්ධේ දම් සුගන්ධේ

මල් සුගන්දේ දම් සුගන්දේ සිල් සුළං රැල් පාවෙලා
සම්බුදුන් සම්භාවනීයයි සාදු සාදු වන්දනා //

මිහින්තලාවයි දහම් අමාවයි ශාන්ත අනුබුදු නාමයයි
කාට කාටත් මේ කියන්නේ ශාසනේ ඉතිහාසයයි //
රත්නමාලී සෑ රදුන් මේ බඹුන් පූජා ලබයි
මේ මහා ගල් මුල් කියන්නේ ඒ උතුම් අභිමානයයි //

මල් සුගන්දේ ....

රැල් නගා හෝ ගා ගලන්නේ ජාතියේ ජය පානයයි
සිංහලේ විකුමන් කියන්නේ මේ පොළොන්නරු දේශයයි //
දාගැබයි මහ මේඝයයි නිල්වන් ගුවන් ගැබ යාවුණේ
ගල් කුළින් සිත්තම් වුණාදෝ මෙත් සිහිල් කරුණා ගුණේ //

මල් සුගන්දේ ....

මහ රජුන් තුන් සිංහලේ මෙහෙමයි එදා දස්කම් කළේ
මේ උතුම් දහමින් තමා ලේ මස් පවා විස්කම් කළේ //
ධීරවීරයි පූජනීයයි නෑ නිමක් ගුණ ගායනේ
සිව් මහා දෙවිඳුන් රකීවි මේ අපේ බුදු ශාසනේ //

නිහාල් ඒ ජයසිංහයන්ගේ රචනයක් පී එල් ඒ සෝමපාලයන්ගේ සංගීතයෙන් රසවත්ව මොහිදීන් බේග් හා සුජාතා අත්තනායක ගායක යුවල විසින් විසින් මධුර ස්වරයට පත් කරන ලද මේ ගීතය පොසොන් උදාවේ අභිමානය එකසේ අදටත් රටපුරා අනුස්මරණය කෙරෙන්නකි. සරළ එහෙත් අපූර්ව ගේය පද වැල ඔචිත්‍ය රිද්මයකට සංගීතවත් කිරීමෙන් බැති බර ශ්‍රද්ධාවත් සමග අනුරපුර පූජනීයත්වය කුලු ගැන්වීමට සමත් වී ඇති ආකාරයක් පෙනී යයි.

ගීතය 4

## දන්නෝ බුදුන්ගේ

(දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා
ජේවී රකිති සොඳ ශීලේ නිබන්දා)//

ක්ලේශ නස්නා භික්ෂු ඇත්තේය බොහොසේ
රහතුන් නිවසනා පායා ප්‍රකාශේ//

(භූලෝ මතේහි දෙව්ලෝ පෑවාසේ
ජේනා මෙපුර මුනි ශාසන වාසෝ)//
ඉර්ද්ධියෙන් යන්නාවූ නෙක් රහතුන්ගේ//
සෙවනැල්ලෙනි හිරු රශ්මිය හන්ගේ//

(මානෙල් නෙලුම් හා ඕලු පුෂ්පාදි
ඇත්තෙ පොකුණුවල බෝ ජල සෑදී)//
සේරු පන්ති පන්ති එනති බොහොසේ//
අනුරාධ නගරය දැන් පෙනේ ඔස්සේ

ප්‍රකට ශ්‍රී ලාංකික නූර්ති නාට්‍ය කරුවකු වන ජෝන් ද සිල්වා ශූරීන්ගේ සිරි සඟ බෝ නාට්‍යයේ එන මෙම ගීතය එක්දාස් නවසිය ගණන් වල සිට ඇතැම් විට රාජ්‍ය ගීතයක් ලෙසද ප්‍රකට බෙද්ධ සළකුණකි.. මහින්දාගමනයෙන් ප්‍රභාමත් වූ අනුරාධපුර බෞද්ධ ප්‍රබෝධයෙන් ඔපවත්ව රහතන් වහන්සේලා සෘධියෙන් වඩිනා මිහිපිට දෙව් ලොවක් බවට පත්වූ විලාසයත් ඊට අනුගත වූ ස්වභාව ධර්ම අලංකාරයත් කාව්‍යෝක්තියට ලක් වූ අපූර්ව ගේය පද්‍යයක් ලෙස මෙය සැළකිය හැකිය.. ගීතය නූර්ති සංගීතයෙන් අංකෘතය..

ගීතය 5

## පොසොන් පොහෝ දින

**පොසෝන පොහෝ දින පූණ් සඳ පායා**
**කාන්ති දේ අඹරේ**
**නීල කොබෝ සැළලිහිණි ගිරා දෙති**
**මනහර ගී නාදේ**
**මිහින්තලා ඒ පර්වත මුදුණේ**
**ඒ අඹ රැක සෙවණේ**
**කිම ආ අහසේ නැගි ආලෝකේ**
**කාන්ති ප්‍රභා විහිදේ**

**තිස්ස අපේ ලක් රජිඳා**
**ගොස් වන දඩ කෙළියේ**
**මුවකු ලුහුබැඳ යන ඒ මොහොතේ**
**ඇතී දුනු දිය සුරතේ**

**තිස්ස තිස්ස යන නමින් තිගැස්සී**
**වට වට පිට බලන සඳේ**
**මහින්ද ඒ මහ රහත් හිමි දැකා**
**වැටී දණින් සැණිනේ**
**පොසොන් පොහෝ දින....**

ආනන්ද සමරකෝන් සංගීතවේදියාගේ ගේය පද රචනයෙන් සංගීතයෙන් හා ගයනයෙන් යුක්ත වූ මේ පොසොන් ගීතය මෙහි එන ප්‍රථම ගීතය මෙන් පුරාවෘත්තයේ සිද්ධිමාලාව සෘජුවම අනුස්මරණය කිරීමකි.. උත්තර භාරතීය සංගීත ලක්ෂණ සහිතව බුද්ධානුස්මතිය දැල්වීමට ගත් ආරම්භක නිර්මාණයක් ලෙස එය අගය කළ යුත්තකි..

දෙවන පියතිස් රජු මුහුණ පෑ අහම්බය රටේ සංස්කෘතිය වෙනස් කිරීමට කෙසේ බලපෑවේද යන්න ගීතයෙන් ධ්වනිත කරවයි..

33 වන පිටට